**සෞඛ්‍ය අමාත්‍යාංශය**
**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**

# තනතුරු පුරප්පාඩු

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ **පර්යේෂණ නිලධාරී හා සංවර්ධන නිලධාරී** තනතුරු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව දැනට රජයේ සේවයේ නියුතු නිලධාරියෙකු, අයදුම්කරුවකු ලෙස අයදුම් කරන්නේ නම්, ඔහු හෝ ඇය ස්වකීය අමාත්‍යාංශයේ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත යොමුකළ යුතු අතර ඔහු හෝ ඇය බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලදහොත් සේවා ස්ථානයෙන් මුදා හැරිය හැකි බවට සහතිකයක් ද අයදුම්පත සමඟ එවිය යුතුය.

අයදුම්කරුවන් ස්වකීය සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු, මෙය සමග අමුණා ඇති අදාළ අයදුම්පත් ආකෘතියට අනුව සම්පූර්ණ කොට හා අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද සහතික කිරීම සඳහා එම සහතික පත්‍රවල පිටපත් සමඟ, **"සභාපති, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, 11 වන මහල 'ඒ', සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල"** යන ලිපිනයට **2024 / 02 / 12** දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් / තමා විසින් ගෙනැවිත් බාරදීම හෝ විද්‍යුත් තැපැලෙන් (විෂය නිරුවෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර) එවිය යුතුය. අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් හෝ අධිකාරිය වෙත ගෙනැවිත් බාරදීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් අයදුම්පත බහා ඇති ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම / නොගැනීම සම්බන්ධව සියලුම බලතල දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සතුය.

## පර්යේෂණ නිලධාරී (MA 3) - තනතුරු 01

| | |
|---|---|
| අධ්‍යාපන හා වෘත්තීමය සුදුසුකම් | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජ පර්යේෂණ, සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, පර්යේෂණ ක්‍රමය, සංඛ්‍යානය, ජීව විද්‍යාව හා ගණිතය ආදී වූ අනෙකුත් විෂයයන් ඇතුලත් මූලික උපාධියක් ලබා තිබීම. |
| වයස් සීමාව | 2024/02/12 දිනට අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| වැටුප් පරිමාණය | රු (32,200 – 10x445 -11x660- 10x730-05x750- 54,960)<br>(වැටුප් ගෙවීමේදී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි සඳහන් විධිවිධාන අදාළ වේ.) |
| රැකියාවේ ස්වභාවය | ස්ථිර හා අර්ථසාධක සහිත |

## සංවර්ධන නිලධාරී (MA 3) - තනතුරු 01

| | |
|---|---|
| අධ්‍යාපන හා වෘත්තීමය සුදුසුකම් | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මූලික උපාධියක් ලබා තිබීම. |
| වයස් සීමාව | 2024/02/12 දිනට අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| වැටුප් පරිමාණය | රු (32,200 – 10x445 -11x660- 10x730-05x750- 54,960)<br>(වැටුප් ගෙවීමේදී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි සඳහන් විධිවිධාන අදාළ වේ.) |
| රැකියාවේ ස්වභාවය | ස්ථිර හා අර්ථසාධක සහිත |


**සභාපති**
**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**
**11 වන මහල "ඒ"**
**සෙත්සිරිපාය දෙවන අදියර**
**බත්තරමුල්ල**

**දු. අං. - 0112187140 ෆැක්ස් - 0112186024**
**විද්‍යුත් තැපැල - natamoh.lk@gmail.com**
**වෙබ් පිටුව - www.nata.gov.lk**

**2024 / 01 / 26**